**කතරගම ප්‍රාදේශීය සභාව - 2023**

-------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 වියාචනය කළ මතය

කතරගම ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

කතරගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

### 1.2 වියාචනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වියාචනය කළ මතයක් පළ කරනු ලැබේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇතිබව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත්කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව නැත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ප්‍රාදේශීය සභාව විසින් සමාලෝචිත වර්ෂය තුල වැඩ අවසන් කරන ලද රු. 3,806,906 ක් වූ කර්මාන්ත 04 ක වටිනාකම ඉඩම් හා ගොඩනැගිලි යටතේ ප්‍රාග්ධනිත කර නොතිබුණි. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කරන විට ඉඩම් ගොඩනැගිලි යටතේ සටහන් කරමි. | සභාව සතු සියලුම වත්කම්වල වටිනාකම හඳුනාගෙන ගිණුම් ගතකළ යුතුය. |
| (ආ) ස්ථාවර වත්කම් ලේඛනය අනුව රු. 951,737 ක් වූ උපකරණ ඒකක 15 ක වටිනාකම දේපල පිරියත උපකරණ යටතේ ප්‍රාග්ධනිත කර නොතිබුණි. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කරන විට දේපල පිරියත උපකරණ යටතේ ප්‍රාග්ධනිත කරමි. | සභාව සතු සියලුම වත්කම්වල වටිනාකම හඳුනාගෙන ගිණුම් ගතකළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) ස්ථාවර වත්කම් ලේඛනය අනුව උපකරණ වටිනාකම රු. 1,501,703 ක් වුවත් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ රු. 2,091,871 ක් ලෙස රු. 590,168 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කරන ලෙස විෂය නිලධාරී දැනුවත් කර ඇත. | නිවැරදි වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කළ යුතුය. |
| (ඈ) උසාවි දඩ ලේඛනය අනුව සමාලෝචිත වර්ෂයට අදාල උසාවි දඩ ආදායම රු. 2,190,158 ක් සහ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ රු. 1,721,496 ක් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි. | 2024 වර්ෂයේ සිට ලේඛන හා උපලේඛන මාසිකව සංසන්දනාත්මකව සකස් කර ඉදිරිපත් කරන බව. | සභාව සතු සියලු ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) සමාලෝචිත වර්ෂයේ වරිපනම් බදු ආදායම රු. 6,263,051 ක් වුවත්, එය මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනයේ රු. 2,241,631 ක් ලෙස රු.4,021,420 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදී මෙය නිවැරදි කිරීමට සහ ආදායම් ලේඛන නිවැරදිව යාවත්කාලීන කිරීමට විෂය නිලධාරීන් දැනුවත් කර ඇති බව. | සභාව සතු සියලු ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඊ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ හිටි පොදු වෙළඳපල කුලී වටිනාකම රු. 13,967,867 ක් වුවත් එය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයට රු. 10,037,825 ක් ලෙස රු. 3,930,042 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදී මෙය නිවැරදි කිරීමට සහ ආදායම් ලේඛන නිවැරදිව යාවත්කාලීන කිරීමට විෂය නිලධාරීන් දැනුවත් කර ඇති බව. | සභාව සතු සියලු ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (උ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පිළියෙල කරන ලද බැංකු ප්‍රකාශනයේ ඇතුලත් රු. 297,417 ක හඳුනා නොගත් ලැබීම් හා රු. 23,509 ක රඳවා ගැනීමේ බදු ප්‍රතිපූර්ණය කිරීම්වලට අදාල ගැලපීම් මූල්‍ය ප්‍රකාශනවල සිදුකර නොතිබුණි. | මෙම වරද කඩිනමින් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | හඳුනා නොගත් ලැබීම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඌ) මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබුණු වියදම් ණයහිමි උපලේඛනය අනුව වියදම් ණයහිමියෝ රු. 1,707,970 ක් වුවත්, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ රු. 130,157 ක් ලෙස රු. 1,577,813 ක වෙනසක් විය. | කඩිනමින් ණයහිමි ලේඛනය යාවත්කාලීන කිරීමට විෂයභාර නිලධාරී දැනුවත් කර ඇති බව. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී පාලන ගිණුම් සහ ලේඛන එකඟ කළ යුතුය. |
| (එ) මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබුණු පෙර ගෙවුම් ලේඛනය අනුව සමාලෝචිත වර්ෂයට අදාල පෙර ගෙවුම් ශේෂය රු. 47,039 ක් වුවත් එය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ රු. 182,566 ක් ලෙස රු. 135,527 ක වෙනසක් පැවතුණි. | පෙර ගෙවුම් ලේඛනය කඩිනමින් යාවත්කාලීන කිරීමට විෂයභාර නිලධාරී දැනුවත් කර ඇති බව. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී පාලන ගිණුම් සහ ලේඛන එකඟ කළ යුතුය. |
| (ඒ) මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්කරණ ප්‍රතිපත්ති ලෙස උපචිත සංකල්පය මත පදනම්ව ගිණුම් තැබීම සිදුකරන බවට හෙළිදරව් කර තිබුණද ආදායම් වියදම් මුදල් පදනම මත ගිණුම් ගතකර තිබුණි. | 2024 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී උපචිත සංකල්පය මත පදනම්ව ආදායම් වියදම් ගිණුම්ගත කරන බව. | උපචිත සංකල්පය මත ගිණුම් පිළියෙල කළ යුතුය. |
| (ඔ) සභාව විසින් බාහිර පාර්ශවයන්ට එරෙහිව පවරා තිබුණු නඩු 15 ක් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | 2024 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අදාල හෙළිදරව්කිරීම් සිදුකරන බව. | මූල්‍ය ප්‍රකාශනවල අදාල හෙළිදරව්කිරීම් කළ යුතුය. |
| (ඕ) 2020 සහ 2021 වර්ෂවල කඩා ඉවත් කරන ලද රු. 490,000 ක් වූ ගොඩනැගිලි 09 ක් වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත් කර නොතිබුණි. | 2024 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කරන බව. | නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ක) සමාලෝචිත වර්ෂයේ රථගාල් බදු ආදායමට අදාල බිල්කිරීම් රු. 24,399,228 ක් වුවත් එය රු. 3,140,301 ක් ලෙස රු. 21,258,927 ක් අඩුවෙන් මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශනයේ දක්වා තිබුණි. | ඉදිරියේදී මෙය නිවැරදි කිරීමට සහ ආදායම් ලේඛන නිවැරදිව යාවත්කාලීන කිරීමට විෂය නිලධාරීන් දැනුවත් කර ඇති බව. | සභාව සතු සියලු ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ග) සභාව විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රථගාල් හිඟ බදු ආදායම රු. 22,953,719 ක් වුවත් රු. 17,479,225 ක් ලෙස රු. 5,474,494 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදී මෙය නිවැරදි කිරීමට සහ ආදායම් ලේඛන නිවැරදිව යාවත්කාලීන කිරීමට විෂය නිලධාරීන් දැනුවත් කර ඇති බව. | සභාව සතු සියලු ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ච) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සති පොලවල් බදු දීමට අදාල බිල්කිරීම් අනුව ශේෂය රු. 3,379,020 ක් වුවත් එය රු. 2,123,170 ක් ලෙස රු. 1,255,850 ක් අඩුවෙන් ගිණුම්ගතකර තිබුණි. | ඉදිරියේදී මෙය නිවැරදි කිරීමට සහ ආදායම් ලේඛන නිවැරදිව යාවත්කාලීන කිරීමට විෂය නිලධාරීන් දැනුවත් කර ඇති බව. | සභාව සතු සියලු ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ජ) සභාව විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ සතිපොළ බදු ආදායම රු. 1,303,252 ක් වුවත් එය රු. (454,595) ක ඌනතාවයක් ලෙස රු. 1,757,847 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදී මෙය නිවැරදි කිරීමට සහ ආදායම් ලේඛන නිවැරදිව යාවත්කාලීන කිරීමට විෂය නිලධාරීන් දැනුවත් කර ඇති බව. | සභාව සතු සියලු ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ට) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පොදු වැසිකිලි බදුදීමේ ගාස්තු බිල්කිරීම අනුව ශේෂය රු. 3,451,350 ක් වුවත් එය රු. 4,567,924 ක් ලෙස රු. 1,116,574 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදී මෙය නිවැරදි කිරීමට සහ ආදායම් ලේඛන නිවැරදිව යාවත්කාලීන කිරීමට විෂය නිලධාරීන් දැනුවත් කර ඇති බව. | සභාව සතු සියලු ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඩ) සමාලෝචිත වර්ෂයේ කද සුරිඳුගම කඩ කාමර බදුදීමට අදාල බිල්කිරීම් ශේෂය රු. 154,800 ක් වුවත් එය රු. 26,200 ක් ලෙස රු. 128,600 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදී මෙය නිවැරදි කිරීමට සහ ආදායම් ලේඛන නිවැරදිව යාවත්කාලීන කිරීමට විෂය නිලධාරීන් දැනුවත් කර ඇති බව. | සභාව සතු සියලු ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (න) සමාලෝචිත වර්ෂයේ ආප්ප කඩ, මල්කඩ, පොදු වෙළඳපොල කඩ හා රථගාල් කඩ කාමර බදුදීමට අදාල බිල් කිරීම් ශේෂය රු. 4,694,400 ක් වුවත් එය රු. 514,100 ක් ලෙස රු. 4,180,300 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදී මෙය නිවැරදි කිරීමට සහ ආදායම් ලේඛන නිවැරදිව යාවත්කාලීන කිරීමට විෂය නිලධාරීන් දැනුවත් කර ඇති බව. | සභාව සතු සියලු ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ත) සමාලෝචිත වර්ෂය තුල සභාව විසින් මිලදී ගන්නා ලද රු. 81,700 ක උපකරණ වටිනාකම දේපල පිරියත උපකරණ යටතේ ප්‍රාග්ධනිත කර නොතිබුණි. | 2024 වර්ෂයේදී දේපල පිරියත උපකරණ යටතේ ප්‍රාග්ධනිත කරන බව. | සභාව සතු සියලුම වත්කම්වල වටිනාකම හඳුනාගෙන නිවැරදිව ගිණුම් ගතකළ යුතුය. |

## 1.6.2 <u>නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා</u>

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| --------------------------- | --------------------------- | ---------------- |
| (අ) වරිපනම් බදු පරිගණක මෘදුකාංග පද්ධතිය අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු වරිපනම් බදු ශේෂය රු. 18,273,583 ක් වුවත් එය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ රු. 14,649,036 ක් ලෙස රු. 3,624,547 ක වෙනසක් පැවතුණි. | ඉදිරියේදී මෙය නිවැරදි කිරීමට සහ ආදායම් ලේඛන නිවැරදිව යාවත්කාලීන කිරීමට විෂය නිලධාරීන් දැනුවත් කර ඇති බව. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී පාලන ගිණුම් සහ ලේඛන එකඟ කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) මුද්දර ගාස්තු ලේඛනය අනුව සමාලෝචිත වර්ෂයේ මුද්දර ගාස්තු බිල් කිරීම රු. 1,391,833 ක් වුවත්, එය මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශනයේ රු. 2,105,870 ක් ලෙස රු. 714,037 ක වෙනසක් පැවතුණි. | ඉදිරියේදී මෙය නිවැරදි කිරීමට සහ ආදායම් ලේඛන නිවැරදිව යාවත්කාලීන කිරීමට විෂය නිලධාරීන් දැනුවත් කර ඇති බව. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී පාලන ගිණුම් සහ ලේඛන එකඟ කළ යුතුය. |
| (ඇ) මුද්දර ගාස්තු ලේඛනය අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම රු. 2,075,199 ක් වුවත් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයට රු. 4,321,365 ක් ලෙස රු.2,246,166 ක වෙනසක් පැවතුණි. | ඉදිරියේදී මෙය නිවැරදි කිරීමට සහ ආදායම් ලේඛන නිවැරදිව යාවත්කාලීන කිරීමට විෂය නිලධාරීන් දැනුවත් කර ඇති බව. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී පාලන ගිණුම් සහ ලේඛන එකඟ කළ යුතුය. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------------- | ---------------------------- | ---------------- |
| වටිනාකම රු. 410,443,659 ක් වූ වත්කම් විෂයයන් 15 ක් සහ වගකීම් විෂයන් 08 කට අදාලව හිමිකම් ඔප්පු, තක්සේරු වාර්තා, ස්ථාවර වත්කම් ලේඛනය, උපලේඛන, යාවත්කාලීන කරන ලද තොග ලේඛනය, සමීක්ෂණ මණ්ඩල වාර්තා, යාවත්කාලීන කරන ලද හිඟ ආදායම් ලේඛන, යාවත්කාලීන කරන ලද ණයහිමි ලේඛනය සහ යාවත්කාලීන කරන ලද තැන්පත් ලේඛන ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | සභාව සතු වත්කම් විධිමත් පරිදි තක්සේරු කිරීමටත් ස්ථාවර වත්කම් ලේඛන ඇතුළු අනෙකුත් උපලේඛන කඩිනමින් නිවැරදිව යාවත්කාලීන කිරීමටත් විෂය නිලධාරීන් දැනුවත් කර ඇත. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

## 1.5 අනුකූල නොවීම්

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත** 24(1) (අ) වගන්තිය | සභාව විසින් පවත්වාගෙන යනු ලබන මාර්ග ඉන්වෙන්ට්‍රියේ ඇතුළත් මාර්ග 319 ක් ගැසට් පත්‍රයේ පළකර නොතිබුණි. | 2024 වර්ෂයේ දී මාර්ග ගැසට් පත්‍රයේ පළකිරීමට කටයුතු කරන බව. | මාර්ග ඉන්වෙන්ට්‍රිය යාවත්කාලීනකර ගැසට් පත්‍රයේ එලකළ යුතුය. |
| **(ආ)** ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ | | | |
| (i) මුදල් රෙගුලාසි 104(4) | ප්‍රාදේශීය සභාවට අයත් කෘෘ කැබ් රථය 2022 මාර්තු 30 දින අනතුරකට ලක්ව තිබුණු අතර ඒ සම්බන්ධයෙන් පූර්ණ වාර්තාවක් ලබාගෙන නොතිබුණි. | ප්‍රාරම්භක වාර්තාව සහකාර පළාත් පාලන කොමසාරිස් වෙත යොමුකර ඇති අතර අනුමැතිය ලැබුණු පසු පූර්ණ වාර්තාව ලබා ගන්නා බව. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |
| (ii) මුදල් රෙගුලාසි 396 | එකතු වටිනාකම රු.157,056 ක් වූ කල් ඉකුත් වූ චෙක්පත් 17 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි අනුව කටයුතු කර නොතිබුණි. | අදාල පාර්ශව දැනුවත් කර ඇති අතර පිළිතුරු නොලැබෙන්නේ නම් රජයේ ආදායමට ගැනීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ ලේකම්ගේ අංක 30/2016 හා 2016 දෙසැම්බර් 29 දිනැති චක්‍රලේඛයේ 3.1 ඡේදය | වාහන 13 ක් සම්බන්ධයෙන් ඉන්ධන දහන පරීක්ෂාව සිදුකර නොතිබුණි. | ඉදිරියේදී ඉන්ධන දහන පරීක්ෂාව කිරීමට කටයුතු කරන බව. | චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනතේ 83(1) වගන්තිය | 2017 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා අනුමත කර තිබුණු ගොඩනැගිලි සැලසුම් 235 ක් අතුරින් සැලසුම් 225 ක් පරීක්ෂා කර අනුකූලතා සහතික නිකුත් කර නොතිබුණි. | අනුකූලතා සහතික ලබා ගන්නා ලෙස අදාල පාර්ශවයන් දැනුවත් කර ඇති බව. | සභා බලප්‍රදේශයේ ගොඩනැගිලි ඉදිකිරීම් සම්බන්ධයෙන් නියාමනය කළ යුතුය. |
| (ඉ) නාගරික සංවර්ධන අධිකාරියේ සභාපතිගේ 1993 නොවැම්බර් 18 දිනැති අංක 15 සැලසුම් චක්‍රලේඛය | චක්‍රලේඛයට අනුකූලව කටයුතු කිරීමකින් තොරව නාගරික සංවර්ධන අධිකාරිය යටතේ ලද මුදල් ප්‍රාදේශීය සභාව විසින් පවත්වා ගෙන යන ගිණුමෙහිම රදවාගෙන වියදම් දරා තිබීම හේතුවෙන් එම මුදල් වෙනත් කාර්යයක් සඳහා යෙදවීමේ අවධානමක් පවතින බව නිරීක්ෂණය විය. | චක්‍රලේඛය ප්‍රකාරව වෙනම ගිණුමක් ආරම්භ කිරීමට විෂය නිලධාරි දැනුවත් කර ඇති බව. | චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. |
| (ඊ) 2002 පෙබරවාරි 25 දිනැති අංක 01/2002 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය. | සභාව සතු වාහන 07 ක රාජ්‍ය ලාංඡනය හා ආයතනයේ නම පින්තාරු කර නොතිබුණි. | කඩිනමින් වාහනවල රාජ්‍ය ලාංඡනය හා ආයතනයේ නම පින්තාරු කිරීමට කටයුතු කරන බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (උ) විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශ ලේකම්ගේ 2010 අගෝස්තු 17 දිනැති චක්‍රලේඛය. | වීථි ආලෝකකරණය සම්බන්ධයෙන් ලංකා විදුලිබල මණ්ඩලය සමඟ ගිවිසුම්ගත වී නොතිබුණි. | ඉදිරියේදී ලංකා විදුලිබල මණ්ඩලය සමඟ ගිවිසුම්ගතවීමට කටයුතු කරන බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඌ) භාණ්ඩාගාර ලේකම්ගේ 2020 ඔක්තෝබර් 02 දිනැති අංක 05/2020 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය. | වාහන 05 ක් මාස 06 සිට වසර 03 ක කාලයක් අලුත්වැඩියා කිරීමකින් තොරව අක්‍රීයව පැවතුණි. | මෙම වාහන ඉදිරියේදී අලුත්වැඩියා කිරීමට කටයුතු කරන බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. <u>මූල්‍ය සමාලෝචනය</u>

### 2.1 <u>මූල්‍ය ප්‍රතිඵලය</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 4,944,418 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 11,925,420 ක් විය.

### 2.2 <u>ආදායම් පරිපාලනය</u>

#### 2.2.1 <u>ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්</u>

සභා ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | | ඇස්තමේන්තුගත ආදායම<br>රු. | බිල් කළ ආදායම<br>රු. | රැස්කළ ආදායම<br>රු. | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය<br>රු. | ඇස්තමේන්තුගත ආදායම<br>රු. | බිල් කළ ආදායම<br>රු. | රැස්කළ ආදායම<br>රු. | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය<br>රු. |
| (i) | වරිපනම් හා බදු | 9,216,382 | 6,263,052 | 2,272,834 | 3,900,088 | 9,210,807 | 6,263,051 | 1,582,320 | 4,590,865 |
| (ii) | කුලී | 18,374,300 | 3,208,680 | 338,800 | 2,869,880 | 18,263,500 | 4,539,000 | 557,475 | 3,980,025 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,230,500 | 1,560,650 | 1,560,650 | - | 2,230,500 | 841,350 | 841,350 | - |
| (iv) | වෙනත් ආදායම් | 19,319,125 | 10,298,988 | 10,298,988 | - | 19,214,125 | 14,682,743 | 14,682,743 | - |
| | එකතුව | --------------<br>49,140,307<br>======== | --------------<br>21,331,370<br>======== | --------------<br>14,471,272<br>======== | --------------<br>6,769,968<br>======== | --------------<br>48,918,932<br>======== | --------------<br>26,326,144<br>========= | -------------<br>17,663,888<br>======== | --------------<br>8,570,890<br>======== |

### 2.2.2 <u>ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය</u>

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| <u>වරිපනම් හා බදු</u> | | |
| (අ) සමාලෝචිත වර්ෂයේ බිල් කරන ලද රු. 6,263,052 ක් වූ වරිපනම් බදු ආදායමෙන් 2023 දෙසැම්බර් 31 දිනට රු. 3,990,217 ක් හෙවත් සියයට 64 ක් අයකරගෙන නොතිබුණි. | ඉදිරියේදී හිඟ වරිපනම් අයකර ගැනීමට කටයුතු කරන බව. | බිල්කළ ආදායම් රැස් කරගත යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂය ආරම්භයේ පැවති රු. 17,987,143 ක් වූ හිඟ වරිපනම් බදු ආදායමින් රු. 14,283,366 ක් හෙවත් සියයට 79 ක ප්‍රමාණයක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ වරිපනම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරමි. | හිඟ වරිපනම් කඩිනමින් අයකර ගත යුතුය. |
| (ඇ) සමාලෝචිත වර්ෂයේ බිල් කරන ලද රු. 19,824,598 ක් වූ ටෙන්ඩර් දේපල බදුදීම් ආදායමෙන් රු. 13,588,823 ක් හෙවත් සියයට 69 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකර ගැනීමට පැවතුණි. | ඉදිරියේදී හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කරන බව. | බිල්කළ ආදායම් රැස් කරගත යුතුය. |
| (ඈ) සමාලෝචිත වර්ෂය ආරම්භයේදී පැවති රු. 15,641,245 ක වූ හිඟ ටෙන්ඩර් දේපල බදු ආදායමින් වර්ෂය තුලදී රු. 15,608,425 ක් හෙවත් සියයට 99 ක ප්‍රමාණයක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකරගෙන නොතිබුණි. | බදුකරුවන් 15 දෙනෙකුට විරුද්ධව නඩු පවරා ඇති අතර හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය. |

**<u>කුලී</u>**

| | | |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ බිල් කරන ලද රු. 5,366,667 ක් වූ කඩ කාමර කුලී ආදායමෙන් 2023 දෙසැම්බර් 31 දිනට රු. 4,918,567 ක් හෙවත් සියයට 92 ක් අයකරගෙන නොතිබුණි. | ඉදිරියේදී හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කරන බව. | බිල්කළ ආදායම් රැස්කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂය ආරම්භයේ පැවති රු. 11,293,025 ක හිඟ කඩ කාමර කුලී ආදායමින් රු. 9,615,415 ක් හෙවත් සියයට 85 ක ප්‍රමාණයක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකරගෙන නොතිබුණි. | හිඟ කුලී සහිත කඩහිමියන්ට විරුද්ධව මූලික නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇත. | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය. |

**<u>වෙනත් ආදායම්</u>**

| | | |
|---|---|---|
| (අ) බලප්‍රදේශය තුල ආයතන 24 ක් විසින් ප්‍රදර්ශනය කර තිබුණු දැන්වීම් පුවරු වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා සහ ඉකුත් වර්ෂ වෙනුවෙන් අයවිය යුතු රු. 1,002,650 ක කුලී සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අයකරගෙන නොතිබුණි. | හිඟ ආදායම් කඩිනමින් ගෙවන ලෙස අදාල පාර්ශව දැනුවත් කර ඇති බව. | අදාල වර්ෂය තුල ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂය තුල මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය කුලියටදීම වෙනුවෙන් අයවිය යුතු රු. 95,000 ක් හිඟව පැවතුණි. | අදාල ආයතන දැනුවත් කර හිඟ කුලී කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරන බව. | බිල්කළ ආදායම් රැස්කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) 2020 -2023 කාල පරිච්ඡේදයට අදාලව අයවිය යුතු දුරකථන සම්ප්‍රේෂණ කුළුණු ගාස්තු ආදායම රු. 60,000 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගෙන නොතිබුණි. | අදාල පාර්ශවයන් ලිඛිතව දැනුවත් කර ඇති අතර කඩිනමින් හිඟ මුදල් අයකර ගන්නා බව. | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු. 289,497 ක් සහ මුද්දර ගාස්තු රු.1,796,925ක් ගෙන්වාගෙන නොතිබුණි. | උසාවි දඩ මුදල් සහ මුද්දර ගාස්තු අයකර ගැනීමට අදාල ආයතන දැනුවත් කර ඇති බව. | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 1958 අංක 15 දරන සේවක අර්ථ සාධක අරමුදල් පනතේ 10 වන වගන්තිය අනුව සේවකයන් 04 දෙනෙකු සඳහා 2001 ජනවාරි සිට 2016 දෙසැම්බර් දක්වා කාලයට අදාල සේවක අර්ථ සාධක දායක මුදල් නියමිත දිනට නොගෙවීම මත රු. 247,950 ක අධිභාර මුදලක් සහ එම කාලයට අදාලව සේවකයාගෙන් අයකළ යුතු සියයට 08 ක දායක මුදල වූ රු. 198,360 ක මුදල් සභා අරමුදලින් ගෙවා තිබුණි. | අංක 54627 දරන නඩුවේ තීන්දුව අනුව අධිභාර මුදල් ගෙවා ඇති බව. | වගකිවයුතු පාර්ශවයන් හඳුනාගෙන අදාල අධිභාර මුදල් අයකරගත යුතුය. |
| (ආ) 1980 අංක 46 දරන සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලට 2016 මැයි සිට 2022 දෙසැම්බර් දක්වා කාලයට අදාලව සියයට 03 ක දායක මුදල් නොගෙවීම හේතුවෙන් රු. 380,710 ක අධිභාර මුදලක් සභා අරමුදලින් ගෙවා තිබුණි. | සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් මණ්ඩලයේ කළමනාකරුගේ ලිපිය අනුව මෙම මුදල් ගෙවා ඇති බව. | වගකිවයුතු පාර්ශව හඳුනාගෙන අදාල අධිභාර මුදල් අයකරගත යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) 2019 - 2021 වර්ෂවල කාර්යාලීය නොවන පුද්ගලයින් සඳහා රු. 55,000 ක් වටිනා උපපත්‍රිකා පොත් 10 ක් නිකුත් කර තිබුණු අතර 2024 මැයි 08 දින වන විටත් සභාව වෙත බාර ගෙන නොතිබුණි. | එක් පාර්ශවයකට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇති අතර අනෙක් පාර්ශවයන්ගෙන් උපපත්‍රිකා පොත් සහ මුදල් ලබා ගැනීමට කටයුතු කරන බව. | අදාල මුදල් හෝ උප පත්‍රිකා පොත් සභාව වෙත ලබාගත යුතුය. |
| (ඈ) 2018 වර්ෂයේදී මිලදී ගෙන තිබුණු ඇදි සහිත ප්ලාස්ටික් පුටු 200 ක් සහ කෑම මේස පුටු 50 ක් භෞතික පරීක්ෂාවේ දී විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි. | කඩිනමින් විමර්ශනයක් ආරම්භ කර වගකිවයුතු පාර්ශවයන්ගෙන් අදාල භාණ්ඩ ලබා ගැනීමට කටයුතු කරන බව. | වගකිවයුතු පාර්ශවයන් හඳුනාගෙන අදාල අලාභයන් අයකරගත යුතුය. |
| (ඉ) 2021 ජනවාරි මාසයේදී පරිත්‍යාග ලෙස ලැබී තිබුණු ප්ලාස්ටික් වතුර ටැංකි 10 ක් බඩු වට්ටෝරු ලේඛනයේ ඇතුලත් කර නොතිබුණු අතර භෞතිකවද නොතිබුණි. | කඩිනමින් විමර්ශනයක් ආරම්භ කර වගකිවයුතු පාර්ශවයන්ගෙන් අදාල භාණ්ඩ ලබා ගැනීමට කටයුතු කරන බව. | වගකිවයුතු පාර්ශවයන් හඳුනාගෙන අදාල අලාභයන් අයකරගත යුතුය. |
| (ඊ) විශ්‍රාමශාලාව සඳහා 2019 වර්ෂයේ මිලදී ගෙන තිබුණු රු. 28,000 ක් වූ කෑම මේසය අස්ථානගතවී තිබුණු අතර ඒ සම්බන්ධයෙන් කිසිදු පරීක්ෂණයක් සිදුකර නොතිබුණි. | කඩිනමින් විමර්ශනයක් ආරම්භ කර වගකිවයුතු පාර්ශවයන්ගෙන් අදාල භාණ්ඩ ලබා ගැනීමට කටයුතු කරන බව. | වගකිවයුතු පාර්ශවයන් හඳුනාගෙන අදාල අලාභයන් අයකරගත යුතුය. |
| (උ) 2023 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයෙන් ඌණ භාණ්ඩ ලෙස හඳුනාගෙන තිබුණු වටිනාකම හඳුනාගත නොහැකි වර්ග 65 කට අදාල භාණ්ඩ ඒකක 1146 ක් සම්බන්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | ඌන භාණ්ඩ කිහිපයක් සම්බන්ධයෙන් ඊට වගකිවයුතු නිලධාරීන් හඳුනාගෙන ඇති අතර නැවත ලබා ගැනීමට කටයුතු කරන බව. | වගකිවයුතු පාර්ශවයන් හඳුනාගෙන අදාල අලාභයන් අයකරගත යුතුය. |
| (ඌ) සභාවට අයත් ඉඩම් 55 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | ඉඩම්වල අයිතිය සභාවට පවරාගෙන වෘත්තීය තක්සේරුවක් සිදුකර වටිනාකම ගිණුම්ගත කරන බව. | සභාව සතු සියලුම වත්කම්වල වටිනාකම හඳුනාගෙන ගිණුම් ගතකළ යුතුය. |

| | | |
|---|---|---|
| (එ) සමාලෝචිත වර්ෂය තුල සභාවට පරිත්‍යාග ලෙස ලද ප්ලාස්ටික් ජල ටැංකි 05 ක හා ටැබ් පරිගණක යන්ත්‍රයක වටිනාකම තක්සේරු කොට ගිණුම් ගතකර නොතිබුණි. | 2024 වර්ෂයේ දී වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කරන බව. | සභාවට ලැබෙන සියලු වත්කම්වල වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ----------------------- | ------------------------------- | ----------------- |
| (අ) සභාව විසින් අවසන්වරට 2012 වර්ෂයේ දියුණු කළ ප්‍රදේශ හඳුනාගෙන තිබුණද, වරිපනම් බදු අයකළ හැකි ප්‍රදේශ පුළුල් කර ගැනීමට සභාවේ අවධානය යොමු වී නොතිබුණු අතර 2012 වර්ෂයෙන් පසු වරිපනම් බදු තක්සේරුව අලුත්කර නොතිබුණි. | දියුණු කළ ප්‍රදේශ පුළුල් කර ගැනීම සඳහා මෙම ප්‍රදේශ සිතියම්ගත කිරීමේ කටයුතු අවසන් කර ඇති බව. | කාලීනව දියුණු කළ ප්‍රදේශ හඳුනාගෙන වරිපනම් බදු අයකළ යුතුය. |
| (ආ) සභාව සතු කඩ කාමර 150 ක් බදු දී තිබුණද, එම කඩ හිමියන් සමග ගිවිසුම්ගත වී නොතිබුණි. | කඩහිමියන් සමඟ කඩිනමින් ගිවිසුම්ගතවීම සඳහා ඔවුන් දැනුවත් කර ඇති බව. | සභාව සතු දේපල බදුදීමේදී බදුකරුවන් සමඟ ගිවිසුම්ගත විය යුතුය. |

## 3.4 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ----------------------- | ------------------------------ | ----------------- |
| (අ) ප්‍රාදේශීය සභාවට අයත් කැබ් රථයේ ලියාපදිංචි සහතිකය අනුව එන්ජින් අංකය 4M40UAC8154 වුවත් වාහනයේ සඳහන් එන්ජින් අංකය 4M40AH8031 ලෙස සඳහන් වී තිබුණි. | පළාත් යාන්ත්‍රික අධ්‍යක්ෂකගේ නිර්දේශයට යටත්ව නව එන්ජිම සකස් කර ඇති අතර ඉදිරියේදී නව එන්ජින් අංකය ලියාපදිංචි සහතිකයට ඇතුලත් කිරීමට කටයුතු කරන බව. | සභාව සතු වාහන උපයෝජනය හා කළමනාකරණය කිරීම විධිමත් පරිදි කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) සභාව විසින් භාවිතා කරනු ලබන වාහන 07 ක් සභාවට ලැබී වසර 1 සිට 23 දක්වා කාලයක් ගත වී තිබුණද, එම වාහනවල නීත්‍යානුකූල අයිතිය සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | වාහන 2ක ලියාපදිංචි සහතික නොමැති අතර ඉතිරි වාහන ප්‍රාදේශීය සභාව වෙත පවරා ගැනීමට කටයුතු කරමින් සිටින බව. | සභාව සතු වත්කම්වල නීත්‍යානුකූල අයිතිය පවරාගත යුතුය. |

## 3.5 <u>මානව සම්පත් කළමනාකරණය</u>

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ----------------------- | ------------------------------ | ---------------- |
| (අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ තනතුරු 13 කට අදාලව අනුමත කාර්ය මණ්ඩලය අනුව සේවකයින් 34 දෙනෙකුගේ ඌනතාවයක් පැවති අතර එම පුරප්පාඩු පිරවීමට කටයුතුකර නොතිබුණි. | මෙම කාර්ය මණ්ඩල පුරප්පාඩු සම්බන්ධයෙන් මාසිකව පළාත් පාලන දෙපාර්තමේන්තුව දැනුවත් කරන බව. | කාර්ය මණ්ඩල පුරප්පාඩු පුරවාගත යුතුයි. |
| (ආ) ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුතුව සිට මිය ගිය හා විශ්‍රාම ගිය සේවකයින් 05 දෙනෙකුගෙන්, සේවය අතහැර ගිය සහ වැඩ තහනම් වූ සේවකයින් 15 දෙනෙකුගෙන් සහ ස්ථාන මාරු වි ගිය සේවකයින් 05 කුගෙන් පිළිවෙලින් අයවිය යුතු රු. 244,487 ක, රු. 451,702 ක හා රු. 57,587 ක ණය ශේෂ වසර එකකට වඩා වැඩි කාලයක සිට අය නොවී පැවතුණි. | 2024 වර්ෂයේ දී මෙම හිඟ ණය ශේෂයන් අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ණය ශේෂ කඩිනමින් අයකරගත යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වන වගන්තිය අනුව සමාලෝචිත වර්ෂයට අදාලව සභාවේ අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | 2024 වර්ෂයේදී අභ්‍යන්තර විගණනයක් සිදුකරන බව. | සභාවේ අභ්‍යන්තර විගණන කටයුතු කාලීනව සිදුකළ යුතුය. |

### 4.2 විගණන හා කළමනාකරණ කමිටුව

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41 වගන්තිය සහ කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ 2019 ජනවාරි 12 දිනැති අංක ඩීඑම්ජී/01-2019 දරන අභ්‍යන්තර විගණන මාර්ගෝපදේශ චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු පවත්වා නොතිබුණි. | 2023 අගෝස්තු 25 දින විගණන හා කළමනාකරණ කමිටුවක් පවත්වා ඇති බව. | මාර්ගෝපදේශ සහ චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පැවැත්විය යුතුය. |

### 4.3 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ප්‍රාදේශීය සභාව විසින් පිළියෙලකර තිබුණු අයවැය ලේඛනය අනුව ඇස්තමේන්තු කළ ආදායම් හා වියදම්, වර්ෂයේ තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී ආදායම් විෂයයන් 08 ක සියයට 28 සිට සියයට 81 දක්වාද වියදම් විෂයයන් 07 ක සියයට 34 සිට සියයට 207 දක්වාද විචලනයන් පැවතුණි. මේ අනුව අයවැය ලේඛනය ඵලදායි පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. | විචලනයන් අවම වන පරිදි අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස යොදා ගැනීමට කටයුතු කරන බව. | වාර්ෂික අයවැය ඇස්තමේන්තු වඩාත් තාත්විකව පිළියෙල කළ යුතු අතර එම ඉලක්කයන් සපුරා ගැනීමට කටයුතු කළ යුතුය. |

**4.4** <u>තිරසර සංවර්ධන අරමුණු</u>

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ---------------------- | ------------------------------ | ---------------- |
| එක්සත් ජාතීන්ගේ "තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030" පිළිබඳව සභාව දැනුවත්වී තිබුණද, තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීම සඳහා දර්ශක හඳුනාගෙන නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීම සඳහා දර්ශක හඳුනා ගැනීමට කටයුතු කරන බව. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීම සඳහා දර්ශක හඳුනාගත යුතුය. |